පානදුර නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පානදුර නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලදසම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ)2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිජේදයේ 3.7ඡේදය ප්‍රකාරව අයවැය ලේඛනවල අයවැය ගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී අයවැය ගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන බව	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිජේදයේ .330 ඡේදය ප්‍රකාරවමුදල් ප්‍රවාහ ප්‍රකාශනය යටතේ මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම රු.17,162,541 ක් මුදල් ගලා යාමක් ලෙස සටහන් කර තිබුණි.	සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිජේදයේ .329ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යටතේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගැලපීමේදී වර්ෂයේ මුදලින් ලද අගය රු.12,930,235ක් විය යුතු නමුත් රු.13,036,860ක් ලෙස ගලපා තිබුණි.	මෙම මුදල වර්ෂයට අදාල බැවින් ගිණුම් තබා ඇති බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය
(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිජේදයේ .332 ඡේදය ප්‍රකාරවමුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේමෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී KIOSK යන්ත්‍රයේ වර්ෂයට අදාල ආදායම රු.42,572ක් ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තයට ගලපා නොතිබුණු අතර එම යන්ත්‍රයේ ආයෝජනයෙන් ලද ආදායම වූ රු.35,539 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.තවදවියදම් විශ්ලේෂණයේ එම යන්ත්‍රයේ අගය අඩුවීම වෙනම හෙළිදරව් කර ද නොතිබුණි. ප්‍රමිතියේ 3 වන පරිච්ජේදයේ 3.6 ජේදය ප්‍රකාරව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශන කාලපරිච්ජේදයේ ඉදිරිපත්	ඉදිරියේ දී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය

(ඇ)	කර ඇති සියළුම වට්නාකම් සඳහා පෙර වූ සමාන කළ හැකි කාලපරිච්ඡේදය සම්බන්ධ තුලනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත්, පෙර වර්ෂ වට්නාකම් නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය අනුව සමුච්චිත අතිරික්තය රු.666,798,636ක් වන නමුත් වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ එම අගය රු.666,565,418ක් ලෙස දැක්වීම නිසා රු.233,218ක අවිනිශ්චිත ශේෂයක් විය.	ඉදිරියේ දී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලබන බව .	ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට රු.26,258,060ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ගිණුමේ ශේෂය වත්කම් වගකීම් ප්‍රකාශනයේ ශුද්ධ වත්කම් ගණනයේදි සමුච්චිත අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වට්නාකම ලෙස දක්වා නොතිබුණි.	ඉදිරියේ දී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලබන බව .	ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලිවලට අදාල ක්ෂය ඉවත් කිරීම් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී ප්‍රත්‍යාගණන සංචිත ගිණුමරු.24,207 කින් බැර කළ යුතු වුවද සමුච්චිත අරමුදල බැරකරතිබුණි.	ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.7 නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති රීති රෙගුලාසි, ආදීයට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභා ආඥා පනත			
(i)	170 (2) වගන්තිය	හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් සිදු කර නොතිබුණි.	2024 වර්ෂයේදි අංක 03 හා 02කොට්ඨාස අදාළ කරගනිමින් දේපළ තහනම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද බව.	නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	164 (2) වගන්තිය හා1968අංක 14දරන සංචාරක සංවර්ධන පනත	සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි හෝටලයකින් ගාස්තු අයකර නොතිබුණු අතර, මුදල තහවුරු කර ගැනීම සඳහාගිණුම් ප්‍රකාශන ලබාගෙන නොතිබුණි.	ලිපි මඟින් හා ආදායම් පරීක්ෂකවරුන් මඟින් දැනුවත් කරන ලද බව.	නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ආ)	2009අප්‍රේල් 16දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
	(i) 02(i) ඡේදය	ක්ෂේත්‍ර නිළධාරින් තම ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන දිනයන්හිදි එම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීම සිදුකළ යුතු වුවත් උක්ත චක්‍රලේඛයට පටහැනිව සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුර දරණ නිලධාරින් පැමිණීමේ ලේඛණයක් පමණක් පවත්වා තිබුණි.	පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii)02(iv)ඡේදය	නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවද ,ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ නොවූ, සැලසුම් කමිටුවාර 29ක්සඳහා 2024 ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා සැලසුම් කමිටු දීමනා වශයෙන් රු.480,000ක් ගෙවා තිබුණි.	2025 ජනවාරි සිට සැලසුම් කමිටු අවසානයේ ඇඟිලි සලකුණු තැබීම ආරම්භ කර ඇති අතර ,එම දිනයන් සඳහා අතිකාල දීමනා ලබා නොගන්නා බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2012ජුලි 11දිනැති අංක WP/LGD/01/ 2012දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ (XVI)වන ඡේදය	සැලසුම් කමිටු පැවැත්විය යුතු කාලය පැය 02කට වැඩි විය යුතු අතර,එය සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව පැවැත්විය යුතු බව සඳහන් වුවත් සැලසුම් කමිටු සාමාජිකයන් සඳහා ඇඟිලි සලකුණු වාර්තා නොතබන බැවින් සැලසුම් කමිටුව සත්‍ය වශයෙන්ම පැය 2ක් පැවැත්වුවේද යන්න තහවුරු නොවුණි.	2025ජනවාරි මස සිට සැලසුම් කමිටු අවසානයේ ඇඟිලි සලකුණු තැබීම ආරම්භ කර ඇති අතර ,එම දිනයන් සඳහා අතිකාල දීමනා ලබා නොගන්නා බව.	නිත්‍ය රාජකාරි වේලාවෙන් පසු ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නනේ නම් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් වේලාව සනාථකළ යුතු ය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.75,262,532ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.76,395,207ක් විය.

2.2 මූල්‍ය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුමේ රු.5,981,083ක ශේෂයක් පැවති අතර, නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව එය ඵලදායි කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.	මුදල ඵලදායී කාර්යයක් සඳහා යොදා ගැනීමට නොහැකි වූ බව.	නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව ඵලදායි කාර්යයන් සඳහා යොදාගත යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31දිනට හිඟය
		රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
(i)	වරිපනම් හා බදු	73,000	72,252	76,155	40,276	73,000	73,248	57,330	15.918
(ii)	කුලී		8,228	7,612	10,770	6,622	7,833	6,775	10,172
(iii)	බලපත්‍ර ගාස්තු	421	442	442	-	421	460	460	-
(iv)	වෙනත් ආදායම්	2,040	1,965	1,956	9	1,660	1,934	1,944	59
		75,461	82,887	86,165	51,055	81,703	83,475	66,509	26,149

2.3.2 සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කායර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	කාල විශ්ලේෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හා බදුමුළු හිඟය රු.39,639,846 වූ අතර 2024 දෙසැම්බර් 31දිනට ඉන් රු.20,428,110ක් හෙවත් සියයට 52ක් අයකර නොතිබුණි.	2025 පළමු කාර්තුවට අදාළව ජංගම සේවා 07ක් පවත්වා හිඟ මුදල් අය කිරීමට කටයුතු කර ඇති බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	කාල විශ්ලේෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත වරිපනම් හා බදු මුළු හිඟය රු.40,277,610ක් වූ අතර එකී හිඟය තුළ වර්ෂ 01ත් 05ත් අතර හිඟය රු.30,423,130ක් හා වර්ෂ 05ට වැඩි රු9,854,479.ක් වූ අතර,රු.50,000 ඉක්මවූ වරිපනම් ඒකක 92කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.9,705,260ක් විය.	අය කිරීමේ ප්‍රතිශතය සියයට 29.47 ක් වන අතර රු.50,000 ට වැඩි ශේෂ සහිත දේපළ සංඛ්‍යාව 65කින් අයවිය යුතු ශේෂය රු.5,569,990 ක් බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	රාජ්‍ය ආයතන 06කින් 2024දෙසැම්බර් 31 දිනට වරිපනම් ලෙස ලැබියයුතු රු.238,849ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	අදාළ රාජ්‍ය ආයතන 06ට අදාළ තක්සේරු දැන්වීම් සහ අවසන් නිවේදන නිකුත් කර ඇති අතර ආයතන මට්ටමින්ද දැනුවත් කර ඇති බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කසල බදු		
	2024 ජනවාරි 01දිනට රු.2,105,700ක් වූ කසල බදු හිඟයෙන් රු.962,400 එනම් සියයට 45ක් 2024වර්ෂයේ ද අය කරගෙන නොතිබුණි .ඒ අනුව 2024 දෙසැම්බර් 31දිනට අයවිය යුතු මුළු කසළ බදු වටිනාකම රු.2,107,540 වූ අතර සභාව විසින් එය අයකර ගැනීමට සාධනීය පියවරයන් ගෙන නොතිබුණි.	අවසන් ගිණුම අනුව එම ශේෂයන් පිළිවෙලින් රු.2,107,540ක් හා රු.1,105,700ක්වන බවත් , 2024 ජනවාරි 01දිනට වන කසල බදු හිගයෙන් රු.921,400ක මුදලක් කමිටු තීරණයක් මගින් පොතෙන් කපා හැරීම කරන ලද අතර2025මැයි වනවිටරු.1,680,540ක මුදලක් අය කර ගෙන ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **කුලී**

(i)	කඩ කුලී තොරතුරු වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන කුලී එකතු කළ යුතු ආදායම රු.16,697,007ක් වූ අතර 2024දෙසැම්බර් 31දින වන විට සියයට 60ක් වූ රු.10,154,765 ක මුදලක් අයකර ගත යුතුව පැවතිණි.	තවදුරටත් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සභාව විසින් කුලියට ලබා දී ඇති මාර්කට් පාර කඩ කාමර 18කට අදාලව 2024 දෙසැම්බර් 31දිනට රු.7,661,875ක ආදායමක් එකතු කර ගැනීමට සභාව අපොහොසත් වි තිබුණි.	හිඟ මුදල අයකරගැනීමට කටයුතු සිදුකරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	අංක L18 දරණ කඩ කාමරය පවත්වාගෙන යනු ලබන කඩහිමියා සහ නගර සභාව අතර කිසිදු ලිඛිත ගිවිසුමක් නොමැති අතර ,එම කඩ කාමරයෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ මුදල රු.2,068,000ක් විය.	ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	දුම්රිය දෙපාර්තුමේන්තුවට අයත් සභාව විසින් අවුරුදු 99ක කාලයකට බද්දට ලබාගෙන තිබුණු දුම්රියපල පාර ඉඩමේ බදු කාලය 1983දෙසැම්බර් 31දිනෙන් අවසන් වන බව දුම්රිය දෙපාර්තුමේන්තුවේ ලිපියක් අනුව සනාථ වී තිබුණු ද එම බදු ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවුණු අතර එම ඉඩමේ දුම්රියපොළ පාරකඩකාමර 22කින් සභාව විසින් පවත්වාගෙන යනු ලබන කඩ කාමර පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.		
(i)	මෙම කඩකුලී හිමියන් සහ නගර සභාව අතර ඇතිකර ගෙන ඇති ගිවිසුම් කාලය ද ඉක්මවා ගොස් තිබුණද දීර්ඝ කාලයක් පුරාවට නව ගිවිසුම් සඳහා එළඹීමට නගර සභාව කටයුතු කර නොතිබුණි.	ගිවිසුම් ගත වීමට පැමිණෙන ලෙස දන්වා ලිපි මගින් බදු හිමියන්ට දැනුවත් කර ඇති බව.	ගිවිසුම් ගතවිමට කටයුතු කළ යුතුය.
(ii)	දුම්රියපල පාර කඩ සඳහා වන නව යෝජනාවට අනුව 2018ජනවාරි 01 දින සිට කඩ කුලී මුදල් අය කිරීමට 2019අගෝස්තු 01දින මහා සභාවේදී තීරණය කර තිබුණු බැවින් පෙර පැවති තක්සේරුවට වඩා නව තක්සේරු මුදල වැඩි වීම නිසා එය ගෙවීම බදුකරුවන් ප්‍රතික්ෂේප කර තිබුණි. ඔවුන් විසින් දිගින් දිගටම පැරණි තක්සේරු මුදලම ගෙවීම නිසා හිඟයක් ඇති වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට	2025.05.25දින වන විට රු.67,680 ක මුදලක් අයකරගෙන ඇති අතර,හිඟ පැවැති කඩ සංඛ්‍යාව10දක්වා අඩු වි ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය .

	එම හිඟය කඩ කාමර 14කින් රු.835,368ක් විය.		
(iii)	සභාව විසින් 99 අවුරුද්දකට බද්දට ගත් දුම්රියපල පාර ඉඩම කුලී පදනම මත ලබා දී තිබුණු කුලී හිමියන් 22දෙදෙනා විසින් තම අභිමතය පරිදි එහි ගොඩනැගිලි ඉදිකරවා ගෙන ඇති අතර ,එම කඩ කාමර තනා ඇති බිම් කොටස් පානදුර නගර සභාව විසින් ලබා දි ඇති ආකාරය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	නිශ්චිතපිළිතුරුක් ලබා දි නොමැත.	අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	නගර සභාව විසින් තාවකාලික වෙළඳ සංකීර්ණය තුළ කඩ කාමර 54ක් කුලී පදනම මත ලබා දී තිබුණු අතර2024 , දෙසැම්බර් 31දිනට අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම රු.795,000ක් විය.	මේ වන විට අවසාන නිවේදන යැවීමට කටයුතු කරමින් පවතින බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.143,290,640 ක් විය.	2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එකතු කළ මුද්දර ගාස්තු මුදල රු.369,000ක් වන බවත්,අයකිරීමට ඉතිරිව ඇති ශේෂය රු.142,921,640ක් බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනත යටතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශ
(අ)	ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් 2024 වර්ෂය තුලදි ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව නේවාසික, ව්‍යාපාරික හා මායිම් තාප්ප වශයෙන් පිළිවෙලින් නේවාසික සැලසුම් 62 ක් අතුරින් සැලසුම් 10 ක් හා ව්‍යාපාරික සැලසුම්16 ක් අතුරින් සැලසුම් 1 ක් හා මායිම් තාප්ප 20ක් අතුරින් සැලසුම් 04ක් 2024දෙසැම්බර් 31දින වන විටත් අනුමත කර නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට අනුකූලතා සහතික ලබා දුන් සංඛ්‍යාව නේවාසික 20ක් හා ව්‍යාපාරික 02ක් විය.	සැලසුම් අයදුම්පත්හී පවතින අඩුපාඩු හේතුවෙන් අනුමත වීම් ප්‍රමාදවීම්සිදු වන අතර, සිදුකළ යුතු සංශෝධනයන් සිදුකර සංශෝධිත සැලසුම්පත් නැවත ලබාදුන් පසු අනුමැතිය සඳහා සැලසුම් කමිටුව වෙත යොමුකරනු ලබන බව.	අයදුම්පත් සම්බන්ධයන් අවශ්‍ය ක්‍රියා මාර්ග කඩිනමින් කළ යුතුය.

(ආ)	තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා 2015සිට 2030දක්වා ව්‍යාපෘති සැලසුම් කර දිගුකාලීන සැලැස්මක් සකස් කර තිබුණද 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත වැඩ සටහන් හඳුනාගෙන එහි ඇතුළත් කර නොතිබුණි.	ක්‍රියාකාරි සැලැස්ම ඉදිරිපත් කර ඇති බව.	තිරසර සංවර්ධන සැලැස්ම තුල 2024 වර්ෂයේ නිමකිරිමට අපේක්ෂිත ඉලක්ක 2024 ක්‍රියාකාරි සැලැස්ම තුල ඇතුලත් විය යුතුය.
(ඇ)	**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**		
(i)	2024 වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කිසිදු ඝන අපද්‍රව්‍යයක් අලෙවි කර නොතිබූ අතර ඉවතලන ආහාර ද්‍රව්‍ය පමණක් අලෙවි කර තිබුණි.	අධික වියදමක් දරා එම අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවට, ආදායම් උත්පාදන ක්‍රමයක් ලෙස සභාවට ආදායම් ගෙන්වා ගත හැකි බැවින් ,අවම සේවකයන් ප්‍රමාණයක් යොදවා ඉදුල් අපද්‍රව්‍ය , ඌරු කෑම සඳහා අලෙවි කිරීම සිදු කරන ලද බව .	ඝණඅපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකළ යුතුය.
(ii)	2024ජනවාරි සිට ජුනි දක්වා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කසල වෙන්කිරීමේ සේවයේ නියුතු 14දෙනෙකු වෙනුවෙන් රු.1,630,508ක් අතිකාල ලෙස ගෙවා තිබූ අතර ,රාත්‍රී සේවා මුර වෙනුවෙන් සේවකයන් 5ක් සඳහා රු.153,130ක මුදලක් වැයකර රාත්‍රියට කෙටි ආහාර සපයා තිබුණි.	2024ජුලි වන විට මෙම වියදමද අවම කර ගනිමින් අතිකාල පමණක් ලබා දෙමින් කසල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන බව .	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකළ යුතුය.
(iii)	2024ජනවාරි සිට අගෝස්තු දක්වා ප්ලාස්ටික් කිලෝ ග්‍රෑම් 1150ක් පමණක් අලෙවි කර තිබූ අතර ,නිරන්තරයෙන් ජනනය වන කසල වශයෙන් එතරම් කුඩා ප්‍රමාණයක් අලෙවි කිරීමට හේතු විගණනයේදී ගැටළු සහගත විය.	එකතු කර ගත් සියලු වෙන් නොකළකසල කසලාංගනය තුල ගොඩ ගැසීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකමක්ද නොමැති වූ අතර වර්ෂාව නිසා ඇතිවන ගැටලු හා ඩෙංගු අවදානම්වාතාවරණයක්ද පැන නැගුණු හෙයින් කසල තොග වැඩිපුර වශයෙන් කෙරවලපිටිය විදුලි ජනනයට හා බේල් කල කසල INSEE ආයතනයටත් ප්‍රවාහනය කිරීමට සිදු වූ බව .	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	පානදුර නගර සභාව සතු ඉඩම් 6ක වටිනාකම හඳුනාගෙනගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ඉඩම් 06මැනුම් කටයුතු සඳහා ලබා දී ඇති අතර පිඹුරුපත් ලැබුණු වහාම ඉදිරි කටයුතු සිදු කරන බව.	ඉඩම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	2000 වර්ෂයට පෙර සිට පැවත එන අත්තිකාරම් මුදල් වටිනාකම වූ රු.1,075,318 සමාලෝචිත වර්ෂයේදී ද අය කර නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සභාවේ ව්‍යාපෘති හා අවශ්‍යතා වෙනුවෙන් ශ්‍රම පදනම මත 2023වර්ෂයේදී සේවකයින් දෙදෙනෙකු සහ සමාලෝචිත වර්ෂයේදී සේවකයින් නවදෙනෙකු බඳවාගෙන තිබුණි.	බල ප්‍රදේශයේ කසළ අපහරණය කිරීම සඳහා දැනට සිටින සෞඛ්‍ය කම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් හා මේ වන විට බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ,කසළ අපහරණ කටයුතු අඛණ්ඩව සිදු කිරීමේ අවශ්‍යතාවය මත ශ්‍රම මිළදී ගැනීමේ පදනම යටතේ සේවකයින් ලබා ගැනීම සිදුකර ඇති බව.	අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර අනුමත කරවා ගත යුතුය.
(ආ)	ස්ථාන මාරු වි පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල ආයතන වෙත එකවර පියවිය යුතු වුවත් සභාවෙන් ස්ථාන මාරු වි ගිය සේවකයන් 8 දෙනෙකුගෙන් එකතුවරු.1,729,522ක ණය ශේෂයක් පියවා නොතිබුණි.	ස්ථාන මැරු වී ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් තුන්දෙනෙකුගේ ණය ශේෂයන් නිරවුල් කර ඇති බවත් 09දෙනෙකුගෙන් අදාළ වාරික මාසිකව ලැබෙමින් පවතින බවත් එම මුදලේ ණය ශේෂය වටිනාකම රු.1,443,370ක් වන බව.	ණය ශේෂ පියවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.50,832,763ක් වන අතර, අයකරගත නොහැකි හා විස්තර නොදන්නා ණය ශේෂ රු.521,639 ක් විය.2024 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වි ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.2,234,332ක් ද, විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,356,900ක් ද, මියගිය හා සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.958,651ක් ද විය.	සේවය හැර ගිය හා මියගිය නිලධාරින්ගේ අයවිය යුතු ශේෂය රු.911,652ක් දක්වා අඩු වි ඇති බවත්, මෙම ණය ශේෂයන් ඉදිරියේදි මාසිකව අයකරන අතර , අනෙක් සේවකයින්ගේද ණය ශේෂයන් අයකිරීමට කටයුතු කරන බව.	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පානදුර මුහුදු වෙරළේ තැබීමට පානදුර නගර සභාවට පරිත්‍යාගයක් ලෙස ලද වැසිකිලි පද්ධතියක් සහිත කන්ටේනර් බහාලුම අළුත්වැඩියා කිරීම සඳහා රු.189,040 ක මුදලකට 2020 ජුනි 23 දින පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. 2020 සැප්තැම්බර් 23 දක්වා ඔවුන් විසින් අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින විට නගර සභාව විසින් එහි වහලය සවි කිරීම සඳහා ව්‍යාපෘතිය තාවකාලිකව නවතා තිබුණි. නමුත් 2020 වසරේ සිට මේ දක්වා එම ව්‍යාපාතිය නැවත ක්‍රියාත්මක කර නොමැති අතර, මං් වන විට දුම්රියපල පාරේ ගාල් කර ඇති කන්ටේනර් බහාලුම භාවිතයට ගත නොහැකි ලෙස දිරාපත් වී තිබුණි.	ඇස්තමේන්තුව නැවත විශ්ලේෂණය සඳහා කර්මාන්ත කමිටුවේ නිර්දේශය මත 2020 සැප්තැම්බර් 10 මහ සභාව මඟින් තීරණය කර ඇති හෙයින් මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී ජ්නල් මඟින් ඉවත් කර ඇති බව .	නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයටගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	නගර සභාවේ කාර්යාල කටයුතු පරිගණකගත කිරීම සඳහා විෂයන් 07 ක් සහිත මෘදුකාංග පද්ධතියක් 2017 වර්ෂයේදී පුද්ගලික සමාගමකින් මිලදිගෙන 2022 වර්ෂය සඳහා සේවා ගාස්තු ලෙස රු.178,500ක් ගෙවා තිබුණි. තවද, 2017 ජුනි 14 දින රු.295,000 ක් ගෙවා ලබාගෙන තිබු වැටුප් හා මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එම මෘදුකාංගය මිලදි ගත් මුදලට අමතරව භාවිතා නොකර සේවා සඳහාද ගාස්තු ගෙවීම් සිදු කරන බවද නිරීක්ෂණය විය.	සේවා ගිවිසුමේ 5.2 වගන්තිය ප්‍රකාරව සාමාන්‍යයෙන් මෘදුකාංග අළෙවි කිරීමෙන් පසු මෘදුකාංගයේ මුළු වටිනාකමින් සියයට 20ක ප්‍රමාණයක් සේවා ගාස්තු වශයෙන් වාර්ෂිකව ගෙවිය යුතු නමුත් නෙක්ෆා ආයතනය සපයන සේවාව සඳහා මෘදුකාංගයේ වටිනකමින් සියයට 5ක් බැගින් වාර්ෂිකව අය කිරීම සිදුකර ඇති බවත්. ලබාගන්නා එක් එක් මෘදුකාංගයේ වටිනාකම සේවා ගාස්තු ගෙවන්නේ නම් මුළු කොටස් වටිනාකමින් සියයට 10ක සේවා ගාස්තුවක් වාර්ෂිකව අය කරනු ලබන බව අදාල ආයතනයෙන් දන්වා ඇත. ඒ අනුව පද්ධතියේ මුළු වටිනාකමින් සියයට 5 ක මුදලක් සේවා ගාස්තු ගෙවීම ආයතනයට වාසිදායක වන බැවින් ඒ අනුව කටයුතු කර ඇති බව .	මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව සතුව පවතිනට්‍රැක්ටරයක් අපහරණය කිරීමට 2022 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	2024 ජුනි 05 දිනැතිව අපරණය සඳහා කමිටුවක් පත් කර ඇති අතර,ඉදිරි කටයුතු සිදු කරමින් පවතිනබව.	කඩිනමින් වත්කම් අපහරණයට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පානදුර නගර සභාවේ 2024 වසරේ අයවැය ලේඛනය මගින් පුනරාවර්තන නොවන වියදම් සඳහා රු.28,635,100ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සත්‍ය වශයෙන් දරා තිබූ වියදම රු.1,015,167ක් විය.	ඉතිරි වී ඇති මුදලින් ව්‍යාපෘති ණයහිමි ලෙස 2025වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල් ද සියයට 10 අත රඳවුම් මුදල් සහ සංකේතාත්මකව වෙන් කර ඇති මුදල්ද (රු100ඇතුළත්ව) ඇති බව	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.
(ආ)	2024දෙසැම්බර් 31දිනට වැය සංකේත 05 ක අයවැය ගත ප්‍රතිපාදනය වූ රු.2,200,000කින් රු.2,046,838ක් උපයෝජනය කර නොතිබුණෙන් එහි ඉතිරියේ ප්‍රතිශතය සියයට 82 සිට සියයට 99ක් දක්වා පරාසයක ඌණ උපයෝජිතව පැවතිණි.	පිළිතුරු ලබා දී නොමැත.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.
(ඇ)	2024දෙසැම්බර් 31දිනට කිසිදු වියදමක් දරා නොතිබූ සුභසාධන වැය විෂයය යටතේ වන පෙර පාසැල් නිල ඇඳුම් ද සෞඛ්‍ය වැය විෂයය යටතේ වන අයාලේ යන සතුන් පාලනය කිරීම සඳහා ගෙවීම්, ආහාර සාම්පල් පරීක්ෂා කිරීමේ ගාස්තු, කුණුකසල මෙහෙයවීම් වැය විෂයය යටතේ වන නිල ඇඳුම් වැනි වැය ශීර්ෂයන් 14 ක් සඳහා වෙන් කරන ලද මුදල රු.8,259,100ක් විය .	2024 වර්ෂයේ ප්‍රතිපාදනවලින් රු.233,600 වියදමක් දරා පෙර පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇති අතර ,එය ණයහිමි යටතේ ගෙවීම් සිදු කර ඇති බව .	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.